# ② ව්‍යාපාර පරිසරය - පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | ③ | 06. | ③ | 11. | ② | 16. | ① |
| 02. | ④ | 07. | ② | 12. | ③ | 17. | ② |
| 03. | ② | 08. | ④ | 13. | ④ | 18. | ② |
| 04. | ④ | 09. | ① | 14. | ① | 19. | ① |
| 05. | ① | 10. | ③ | 15. | ④ | 20. | ③ |

21.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| I | සත්‍ය | VI | අසත්‍ය | XI | සත්‍ය | XVI | සත්‍ය |
| II | සත්‍ය | VII | සත්‍ය | XII | අසත්‍ය | XVII | අසත්‍ය |
| III | අසත්‍ය | VIII | සත්‍ය | XIII | සත්‍ය | XVIII | සත්‍ය |
| IV | සත්‍ය | IX | අසත්‍ය | XIV | සත්‍ය | XIX | අසත්‍ය |
| V | සත්‍ය | X | සත්‍ය | XV | සත්‍ය | XX | සත්‍ය |

22.

I. ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී ඊට බලපෑම් ඇති කරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව ව්‍යාපාර පරිසරය ලෙස හැඳින්වේ.

II.




III. ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බලපාන ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක වන විවිධ පාර්ශව සහ ව්‍යාපාරය තුළ පවතින අනෙකුත් සාධක අභ්‍යන්තර පරිසරය ලෙස හැඳින්විය හැකිය.

IV. ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බලපාන ව්‍යාපාරයෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන පාර්ශ්ව සහ බලවේග බාහිර පරිසරය ලෙස හැඳින්විය හැකිය.

23.

I. දේශපාලන පරිසරය

II. (1) දේශීය කහ සඳහා ඉල්ලුම ඉහළ යාම.
(2) දේශීය කහ නිෂ්පාදකයාගේ ආදායම ඉහළ යාම.

24.

I. ගෝලීය පරිසරය

II.

- දේශීය ව්‍යාපාර වල පැවැත්ම අස්ථාවර වීම.
- දේශීය සංස්කෘතියේ අයහපත් වෙනස්කම් ඇති වීම.
- දැඩි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද සහිතව පවත්වාගෙන යා නොහැකි ව්‍යාපාර බිඳ වැටීම.
- සංචාරක කර්මාන්තය හා බැඳුන ව්‍යාපාර බිඳ වැටීම.

25. I

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| • ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම | • අයිතිකරුවන්ගේ මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් නොවීම |
| • කළමනාකරුවන්ගේ අත්දැකීම් | • පුහුණු සේවකයන්ගේ හිඟය |
| • සේවකයින්ගේ විශේෂිත දැනුම හා කුසලතා | • තාක්ෂණ දැනුම යාවත්කාලීන නොවීම |
| • සුවිශේෂී නිෂ්පාදන ක්‍රම | • සේවකයින්ගේ අයහපත් ආකල්ප |
| • පිළිගත් සන්නම් නාමයක් තිබීම | • ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම නුසුදුසු වීම |

II

| අවස්ථා | තර්ජන |
|---|---|
| • පාරිභෝගිකයන්ගේ ජීවන රටාව වෙනස් වීම | • ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම |
| • රජය විසින් අඩු පොලී ණය ක්‍රම හඳුන්වා දීම | • තරඟකරුවන් බිහිවීම |
| • ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම | • ස්වභාවික ආපදා |
| • නව නගර නිර්මාණය | • නව තාක්ෂණ ක්‍රම සඳහා අනුගත වීම දුෂ්කර වීම |
| • අධිවේගී මාර්ග ඉදි කිරීම | • දේශපාලන අස්ථාවර බව |

26.

I.

- පොලී අනුපාතය
- උද්ධමනය
- ආදායම් ව්‍යාප්තිය
- රැකියා නියුක්තිය
- ජාත්‍යන්තර සබඳතා
- විදේශ විනිමය අනුපාතය
- ඉතුරුම්

II.

පොලී අනුපාතය - බැංකු තැන්පතු සඳහා ලබා දෙන හා බැංකු ණය සඳහා අය කරන පොලී අනුපාතයයි.
උද්ධමනය - භාණ්ඩ හා සේවා අලෙවියේදී තීරණය වන පොදු මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම උද්ධමනයයි.
(10 ශ්‍රේණිය පෙළ පොතේ සඳහන් අනෙකුත් ආර්ථික සාධක පරිශීලනය කරන්න.)

27.

I. 1) පාරිභෝගිකයා.
2) ⁎දේශීය නිෂ්පාදකයා.
⁎ව්‍යාපාරික ප්‍රජාව.
3) පරිසරය ආරක්ෂා කරගැනීම

II. - 2007 අංක 07 දරණ සමාගම් පනත
- 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත
- 1954 අංක 14 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත

III.

| තනතුරු | ආයතන |
|---|---|
| • සමාගම් රෙජිස්ට්‍රාර්වරයා | • පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |
| • මහජන සෞඛ්‍ය පරික්ෂක | • මධ්‍යම පරිසර අධිකාරිය |

28.

I. - පරිගණක තාක්ෂණයේ දියුණුව.
- අන්තර්ජාලය සොයා ගැනීම නිසා සන්නිවේදනයේ ඇති වූ දියුණුව.
- නැනෝ තාක්ෂණය හා ඩිජිටල් තාක්ෂණය සොයා ගැනීම.
- ප්‍රවාහන තාක්ෂණයේ දියුණුව.

II. ✳ අතීතයේදී ඉතා සරල අත් යන්ත්‍ර කිහිපයක් යොදා ගෙන රෙදි නිෂ්පාදනය කළද වර්තමානයේ අති නවීන යන්ත්‍ර සූත්‍ර, පරිගණක තාක්ෂණය ආදිය යොදා ගෙන කෙටි කාලයකින් , ගුණාත්මකව අඩු පිරිවැයකින් රෙදි නිෂ්පාදනය කිරීම.

✳ අතීතයේදී භාවිත කළ සාමාන්‍ය තැපැල වෙනුවට දුරකථන විද්‍යුත් තැපැල (E- mail) ව්‍යාපාර විසින් භාවිතා කිරීම.

✳ අතීතයේදී ව්‍යාපාරිකයන් සිය වෙළෙඳ දැන්වීම් හෝ වෙනත් දැන්වීම් තම තැපැල් ලිපිනය ආදිය ඉදිරිපත් කරමින් වැඩි විස්තර සඳහා ඔවුන්ගේ වෙබ් අඩවියට පිවිසෙන ලෙස දැන්වීම

✳ අතීතයේදී පොත්පත් වල තැබූ ගිණුම් සටහන් වර්තමානයේදී පරිගණක හා තොරතුරු පද්ධති (Information Systems) භාවිත කරමින් පවත්වාගෙන යෑම.

✳ අතීතයේදී මිනිස් ශ්‍රමය පමණක් භාවිත කරමින් සිදු කෙරුණු නිෂ්පාදන ක්‍රියාවලි වර්තමානයේදී පරිගණක ගත කළ යන්ත්‍ර සූත්‍ර මඟින් සිදු කර ගැනිම.

29.

I. ආර්ථික පරිසරය

II.

- ඇමරිකානු ඩොලරය
- බ්‍රිතාන්‍ය පවුම
- ජපන් යෙන්
- ඉන්දියානු රුපියල්
- යූරෝ

} කාලීනව වෙනස් වන අගයන් සලකා බලන්න.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

30.

I. ගෝලීයකරණය යනු ලෝකයේ රටවල් අතර ආර්ථික සමාජීය හා සංස්කෘතික වශයෙන් ඇති අනොන්‍යාන්‍ය බැඳීමයි.

II. <u>හිතකර බලපෑම්</u>
- නවීන තාක්ෂණය ලබා ගත හැකි වීම.
- ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබා ගත හැකි වීම.
- කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබා ගත හැකි වීම.
- විදේශීය ප්‍රාග්ධනය රට තුලට ගලා ඒම.
- දේශීය භාණ්ඩ සඳහා විදේශ වෙළෙඳපොල ලබා ගත හැකි වීම.

31.

I. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනයෙන් ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකි අතර එම ශක්තීන් ව්‍යාපාරයේ වර්ධනය සඳහා යොදා ගත හැකි අතර දුර්වලතා අවම කර ගැනීමට කටයුතු කළ යුතුවේ.

ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුලින් එම ව්‍යාපාරයට ඇති අවස්ථා හා තර්ජන හඳුනාගත හැකිය. එම අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත්, තර්ජන සඳහා මුහුණ දීමටත් ව්‍යාපාරිකයාට හැකිවේ.

II.

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| • ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම. | • අයිතිකරුවන්ගේ මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් නොවීම. |
| • කළමණාකරුවන්ගේ අත්දැකීම්. | • පුහුණු සේවකයන්ගේ හිඟය |
| • සේවකයින්ගේ විශේෂිත දැනුම හා කැපවීම. | • තාක්ෂණ දැනුම යාවත්කාලීන නොවීම. |
| • සුවිශේෂී නිෂ්පාදන ක්‍රම | • සේවකයන්ගේ අයහපත් ආකල්ප |
| • පිළිගත් සන්නම් නාමයක් තිබීම. | • ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම නුසුදුසු වීම. |

| අවස්ථා | තර්ජන |
|---|---|
| • පාරිභෝගිකයන්ගේ ජීවන රටාව වෙනස් වීම. | • ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම |
| • රජය විසින් අඩු පොලී ණය ක්‍රම හඳුන්වා දීම. | • තරඟකරුවන් බිහි වීම. |
| • ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම. | • ස්වභාවික ආපදා |
| • නව නගර නිර්මාණය | • නව තාක්ෂණික ක්‍රම සඳහා අනුගත වීම දුෂ්කර වීම. |
| • අධිවේගී මාර්ග ඉදි කිරීම. | • දේශපාලන අස්ථාවර බව |

32.

I. දේශපාලන පරිසරය

II. - යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති
- අයවැය ප්‍රතිපත්ති

33.

I. භාණ්ඩ හා සේවා අලෙවියේදී තීරණය වන පොදු මිල ගණන අඛණ්ඩව ඉහල යාම උද්ධමනයයි.

II. රටක ජාතික ආදායම එරට ජනතාව අතර බෙදී ගොස් ඇති ආකාරයයි.

III. රටක රැකියා අපේක්ෂා කරන අයට ගැලපෙන රැකියාවක් ලැබීම සේවා නියුක්තිය වන අතර, රටක රැකියා අපේක්ෂා කරන සියලු දෙනාටම ගැලපෙන රැකියාවක් ලැබේ නම් එය පූර්ණ රැකියා නියුක්තියක් ලෙස හැඳින්වේ.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන සේවාව